CPA

CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# ත්‍රිකුණාමල සාම්පූර්හි බර කර්මාන්ත සඳහා ඇති කරන ලද විශේෂ කලාපය අහෝසි කිරීම

2015 මැයි 09

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන විසින් 2015 මැයි 07 දින අංක 1913/19 දරණ (විශේෂ) ගැසට් නිවේදනය මගින් ත්‍රිකුණාමලයේ සාම්පූර්හි බර කර්මාන්ත සඳහා කලාපයක් නිර්මාණය කිරීම හා ආයෝජන මණ්ඩලය සඳහා වෙන් කරන ලද භූමිය අහෝසි කිරීමට ගන්නා ලද තීන්දුව පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉතා සතුටට පත් වෙමු. 1978 අංක 4 දරන ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය පිළිබඳව වූ නීතිය යටතේ (BOI ACT) 22 A වගන්තියට අනුව නිකුත් කරන ලද 2012 මැයි 17 දින දරණ නොම්මර 1758/26 (විශේෂ) ගැසට් නිවේදනය මේ මගින් අහෝසි කරනු ලැබේ.

මෙම අභිනව තීන්දුව 2015 පෙබරවාරි මස කැබිනට් ඇමතිවරුන් විසින් ගන්නා ලද මුල් හිමිකරුවන්ට භූමිය නැවත පවරා දීමට ගත් තීන්දුවේ දිගුවක් වන අතර එය ව්‍යවස්ථාමයව සහතික කරන ලද අයිතීන් සහතික කරමින් සංහිඳියාව වෙනුවෙන් නිවැරදි මොහොතේ ආණ්ඩුව විසින් ගන්නා ලද ඉදිරි පියවරකි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මේ වැදගත් පියවර ගැන සඳහන් කරන්නේ 2006 වසරේ සිට නැගෙනහිර පලාතේ වැසියන්ගේ මානුෂීය අවශ්‍යතාවයන් නිරීක්ෂණය කරන ආයතනයක් වශයෙනි. එහිදී ආයතනයේ විශේෂිත අවධානය යොමු කරනු ලැබූයේ අධි ආරක්ෂිත කලාපය හා කර්මාන්ත කලාප පවත්වාගෙන යාම වැනි විවිධ කාරණා නිසා තම ඉඩම්වල නැවත පදිංචියට යා නොහැකි වූ සාම්පූර් ප්‍රදේශයේ දහස් ගණනක් වූ භූමිය තුල අවතැන් වූ ජනතාව කෙරෙහිය.

2007 නිකුත් කරන ලද 2007 මැයි 30 දින දරණ, අංක 1499/25 දරන (විශේෂ) ගැසට් නිවේදනය මගින් නිර්මිත වූ අධි ආරක්ෂිත කලාපය හේතුවෙන් පුද්ගලයින් 12,000කට පමණ තම භූමිය කරා නැවත යාමේ ඉඩකඩ අහිමි කරනු ලැබීය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සමග ඉඩම් හිමිකරුවන් හතර දෙනෙකු 2007 දී SCFR 218/2007 ගොනුව යටතේ සුප්‍රිම් උසාවියට අභියෝගයක් ඉදිරිපත් කරනු ලැබීය.

පුද්ගලයින් කිහිප දෙනෙකුට තම භූමියේ නැවත පදිංචියට යාමට ඉඩකඩ සළසමින් අධි ආරක්ෂිත කලාපයේ භූමි සීමාව පටු කර ගත්තද, තවමත් පවත්වාගෙන යනු ලැබූ අධි ආරක්ෂිත කලාපය නිසාවෙන් තවත් බොහෝ අයට අවතැන්වම ජීවත් වීමට සිදු විය.
භූමිය තුල අවතැන් වූවන්ට තම භූමියට නැවත යාම වැළැක්වූ, පසුගිය රෙජීමයේ අවසන් මැදිහත් වීම වූයේ 2012 ස්ථාපිත කරනු ලැබූ බර කර්මාන්ත සඳහා වෙන් කල විශේෂ භූමියයි. මෙහිදී ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉඩම් හිමිකරුවන් හත් දෙනෙකුට එම ගැසට් නිවේදනයට අභියෝග කරමින් මූලික අයිතිවාසිකම් අයදුම්පත් ගොනු කිරීමට සහාය දැක්වූ

අතර මේ ක්‍රියාවලියේදී සිදුකරන ලද ආයෝජන මණ්ඩල පනතේ 22 A වගන්තියේ සඳහන් බලතල හා වගකීම් සීමාවෙන් එහාට ගොස් ස්ථාපිත කරනු ලැබූ බර කර්මාන්ත සඳහා වූ විශේෂ කලාපය පිළිබඳ අවිචාරවත් වැඩ පිළිවෙල ගැන නිරාවරණය කරනු ලැබුනි.
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රතිපත්ති පිළිබඳව කෙරෙන සංක්ෂිප්ත කරුණු දැක්වීම් බොහෝමයක සාකච්ඡාවට ගන්නා ලද කාරණයක් වූයේ පුරා අවුරුදු නමයක කාලයක් අවතැන් කඳවුරු තුල ජීවත්වන ජනතාවගේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්ණය හා ඔවුනට මුහුණ දීමට සිදුව ඇති ඉතා දුෂ්කර ජීවන අරගලය පිළිබඳ ගැටලුවයි.

හිතුවක්කාර අධි ආරක්ෂිත කලාපයක් පවත්වාගෙන යාමේ හා ක්‍රමානුකූල නැති, පිළිවෙලකින් තොරව ආරක්ෂක හමුදා සහ තවත් අය විසින් භූමිය පරිහරනය කිරීම පිළිබඳව නැවත පරීක්ෂණයක් සඳහා වන ඉල්ලීම මේ තත්ත්වයන් යටතේ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැවත සඳහන් කිරීමට කැමැත්තෙමු.

මේ ගත් පියවර සමගම යාපනයේ වලිකාමම් උතුරු ප්‍රදේශයේ ඉඩම් ආපසු ලබා දීමට රජය ගත් පියවර ව්‍යවස්ථාමයව හා නෛතිකව අයිතිවාසිකම් තහවුරු කරන, දිගු කාලීන සැලසුම් කෙරෙහි යහපත් පහසුකම් සපයන මුල් පියවරයන් බවට පත් කරගත යුතුව ඇත.

1950 ඉඩම් පවරා ගැනීමේ පනත ප්‍රතිසංස්කරණය සඳහා වූ නිර්දේශය පිළිබඳව සිදුවන ප්‍රමාදයන් කෙරෙහි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දිගින් දිගටම තම උනන්දුව පළකරමු.

කෙසේ වෙතත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැවත ප්‍රකාශ කර සිටින්නේ භූමිය ලබා ගැනීම සඳහාවන ඕනෑම වෑයමක් අවම වශයෙන් පවතින නීති සීමාවන්ට යටත්ව සිදුවිය යුතු බවයි. මෙම ප්‍රශ්ණයන් ලංකාව තුල ජාතික සංහිඳියාව හා තදබල ලෙස බැඳී පවතින හෙයින් තවත් කල් නොයවා විසඳුම් ලබා දිය යුතු බවයි.

**අදාල සිංහල හා දෙමල ගැසට් නිවේදනයන්;**

- Gazette (extraordinary) No.1499/25 dated 30 May 2007 (S / T)
- Gazette (extraordinary) No. 1758/26 issued on 17th May 2012 (S / T)
- Gazette (extraordinary) No. 1913/19 dated 7th May 2015 (S / T)

**මෙම කාරණය සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කරන ලද තවත් ක්‍රියාකාරකම්:**

- භවානි ෆොන්සේකා හා මිරාක් රහීම් - ත්‍රිකුණාමල අධි ආරක්ෂිත කලාපය හා විශේෂ කර්මාන්ත කලාප - සැප්තම්බර් 2009 (Bhavani Fonseka and Mirak Raheem, Trincomalee High Security Zone and Special Economic Zone, September 2009)

- භවානි ෆොන්සේකා හා මිරාක් රහීම් - නැගෙනහිර පලාතේ ඉඩම් - දේශපාලනය, ප්‍රතිපත්ති හා ගැටුම් 2010 මැයි (Bhavani Fonseka and Mirak Raheem, Land in the Eastern Province – Politics, Policy and Conflict, May 2010)

- භවානි ෆොන්සේකා හා දර්ශා ජෙගදීශ්වරන් - ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පලාත්වල ඉඩම් පවරා ගැනීම හා ඒ සම්බන්ධ කාරණා දේශපාලනය, ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් සමගින් - 2013 නොවැම්බර් (Bhavani Fonseka & Dharsha Jegatheeswaran, Politics, Policies and Practices with Land Acquisitions and Related Issues in the North and East of Sri Lanka, November 2013 )